# ජිජී



විතාරා පෙහන්සා යටවර

# පිපී

විතාරා පෙහන්සා යටවර

# පිපී

කතෘ : විතාරා පෙහන්සා යටවර

කතෘගේ වෙනත් කෘති : මට පුළුවනි කවි ලියන්න

හිතුවක්කාර බිංදු

**Tuck Tick Took**

මහාමායා බාලිකා විද්‍යාලය

**8 – F**

කෘතිය පළ කරන දිනය - **2025.02.08**

**ISBN** අංකය : **978 – 624 – 208 – 682 – 8**

# පිදුම

## අසරණ සතුන්ට පිහිට වන

## ඔබ සැමදෙනා වෙත

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.
ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.


අද හරිම අඳුරු දවසක්, මුළු අහසම අඳුරුයි. මට හොඳටම බඩගිනියි. මම නිදා ගන්නකොට හිටියේ අම්මට තුරුල් වෙලා. ඒත් දැන් අම්මා මං ළඟ නෑ. අනේ මගේ අම්මා කොහෙ ගිහින් ද දන්නෙනෑ. මගේ අයියලා, අක්කලා තුන්දෙනාත් අඬනවා ඇහෙනවා. අනේ අම්මේ ඔයා කොහෙද? අපිව මේ කොහෙටද ගෙනත් දාලා තියෙන්නෙ? අනේ ඔයා ඉක්මනට එන්නකෝ. අපිට හරිම බඩගිනියි, සීතලයි.

පාරේ ඒ මේ අත යන මිනිස්සු අපි දිහා බල බලා යනවා. වාහන වල සද්දෙට අපිට හොඳටම බය හිතෙනවා අම්මේ. අපි ළඟට ඉක්මනට එන්නකෝ අම්මේ. දැන් වැස්සකුත් වහිනවා, අපිව හොඳටම තෙමෙනවා. අනේ අම්මේ ඔයා කොහෙද? අපිට කවුරු හරි උදව් කරන්න කෝ.



ඉතින් යාළුවනේ , ඔයගොල්ලො බලනවා ඇති මම කවුද කියලා. මම චූටිම චූටි පූස් බබෙක්. අපේ ගෙදර මාමා කොහෙදෝ අතුරු පාරක් අයිනේ අපිව පෙට්ටියක දාලා ගිහිල්ලා. අපිට දැන් කාත් කවුරුත් නෑ. අපි අසරණ පූස් බබාලා හතර දෙනෙක්.


මට හිතෙන විදිහට දැන් දවස් දෙක තුනක් ම ගෙවිලා ගිහින්. අපි මේ ඉන්න තැන ළඟ ගෙදරක අක්ක කෙනෙක් අපිට වතුරයි කෑමයි ටික ටික ගෙනත් දෙනවා. අනේ ඒත් ඒවා අපිට කන්න හරිම අමාරුයි. අපි තවම ගොඩක් පොඩියි. මොනා කරන්න ද? බඩගිනි වැඩි කමට කොහොම හරි අමාරුවෙන් කනවා.



මෙහෙම ටික දවසක් ගෙවිලා ගියා. වැස්ස හොඳටම වැඩි වෙලා. අපිට ඉන්න බෑ සීතලයි. අපිව හොඳටම තෙමෙනවා. අනේ මගේ එක අයියා කෙනෙක් අද උදේ නැගිට්ටේ නෑ. තාම නිදි. අපි තුන්දෙනාම  එයාට කතා කලා. අනේ ඒත් එයා හෙල්ලෙන්නෙවත් නෑ. එකම විදිහට නිදාගෙන ඉන්නවා.



මට ඇහුනා අපිට කෑම ගේන අක්කා මගේ අයියා හුස්ම ගන්නේ නෑ කියලා තව කෙනෙකුට කියනවා. ඒ අය මගේ අයියව අරගෙන ගියා. කොහෙට ගෙනිච්චද කියලා මම තවම දන්නේ නෑ. අපි දැන් තුන්දෙනයි ඉන්නේ.



අපිට කෑම ගේන අක්කා අපි තුන්දෙනාව ඒ අක්කාගේ ගෙදර ඉස්තෝප්පුවෙන් තිබ්බා. අපි හිටපු පෙට්ටියත් එක්කම. අනේ, මෙතන නම් අපිට තෙමෙන්නේ නැතුව ඉන්න පුලුවන්. ඒත් අම්මා ළඟ හිටියා නම් අපිව එයා හොඳට බලා ගනියි. අපිට සතුටින් කිරි බීලා අම්මාට තුරුල්වෙලා ඉන්න තිබුණා. අනේ අම්මේ ඔයා කොහෙද?




දැන් ටික දවසක් ගෙවිලා ගියා යාළුවනේ. අපි තුන්දෙනාම දැන් පෙට්ටියෙන් එළියේ එහේ මෙහේ ඇවිදිනවා. මේ ගෙදර අක්කා අපිට කෑම දෙනවා. තව මේ ගෙදර චූටි බලු යාළුවො හතරදෙනෙක් ඉන්නවා. ඒ අයගෙන් නම් අපිට හරිම කරදරයි. හැමවෙලාවෙම ඇවිත් අපිව පාගනවා. එහෙට මෙහෙට තල්ලු කරනවා. ඉතින් අපි තුන්දෙනා ගොඩාක් වෙලාවට ඉන්නේ පෙට්ටිය ඇතුලෙමයි. අපි හරිම බයයි මේ බලු යාළුවන්ට.

ඔන්න එක දවසක් අපි තුන්දෙනා සීතලේ ගුලි වෙලා ඉන්න කොට අපි හිටපු තැනට අක්කා කෙනෙකුයි, අම්මා කෙනෙකුයි ආවා. ඒ අක්කා අපිට කතා කලා. මම තමයි ඒ පෙට්ටියෙන් ඉස්සෙල්ලාම එළියට ඇවිල්ලා ඒ අක්කා ළඟට ගියේ. මට හිතුනා ඒ අක්කා හොඳ කෙනෙක් කියලා. ඔව් ඒ අක්කා හරිම හොඳයි යාළුවනේ. මාව හරිම ආදරයෙන් වඩා ගත්තා. ඒ වගේම මාව තුරුල් කරන් අත ගෑවා. එයාගේ අම්මාටත් මාව පෙන්න පෙන්න ගොඩාක් දේවල් කිව්වා. ඒ ගොල්ලන් මොනවාද කිව්වේ කියලා නම් මට හරියට තේරුනේ නෑ. ඒත් ඒ දෙන්නම මගේ දිහා හරිම ආදරයෙන් බලන් හිටියා. මගේ අයියවයි අක්කවයි දෙන්නවමත් අතගෑවා. හැබැයි මාව තමයි වැඩිපුරම ළඟ තියන් හිටියේ.




අපි තුන්දෙනා ඉන්න  ගෙදර ළඟම තමයි මේ අපිව බලන්න ආපු අක්කාගේ ගෙදරත් තියෙන්නේ. දැන් එයා නිතරම  වගේ මාව බලන්න එනවා. සමහර දවස්වලට එයා අපිට රස රස කෑම ගෙනත් දෙනවා. මාව වඩාගෙන තුරුළුකරන් හරිම ආදරයෙන් අතගානවා.



ඔහොම ටික දවසක් ගෙවිලා ගියා. අපි තුන්දෙනා මේ පරිසරයට ටික ටික හුරු වුණා. සමහර වෙලාවට අර අපිව බලන්න එන අක්කා, එයාගේ ගෙදරට ගෙනියලා අපිත් එක්ක සෙල්ලම් කරනවා. හැබැයි ටික වෙලාවකින් අපිව ආපහු ගෙනත් දානවා. මොකද එයාගේ තාත්තා අපිට වැඩිය කැමති නැහැලු.

ඔන්න යාළුවනේ අද තමයි මගේ ජීවිතේ හොඳම දවස. මං කලින් ඔයගොල්ලොන්ට කිව්ව අර අක්කයි අම්මයි දෙන්නම අපිව බලන්න ආවා. ඒ දෙන්නා මාව වඩාගෙන අපි හිටපු ගෙදර අක්කාට මොනවදෝ කියලා අරගෙන ගියා ඒ අයගෙ ගෙදරට.

අනේ මට හොඳටම දුකයි මගේ අයියවයි අක්කවයි දාලා යන්න යාළුවනේ. ඒත් මේ අක්කයි අම්මයි මට හරිම ආදරයෙන් කතා කරනවා. මාව තුරුළුකරගෙන ඉන්නවා, ඒ නිසා මට හරිම සතුටුයි.



අක්කයි, අම්මයි මාව ඒඅයගේ ගෙදරට අරගෙන ආවා. දැන් මට එළියට වෙලා සීතලේ ඉන්න ඕනෙ නෑ. මේ අය මාව ගෙදර ඇතුලේ තියාගන්නවා යාළුවනේ. මේ ගෙදර හරිම ලොකුයි, පිරිසිදුයි. අක්කයි, අම්මයි ඒ තාත්තාට කතා කරලා මාව පෙන්නුවා. ඊට පස්සේ මොනවදෝ කිව්වා. තාත්තා නම් මං ළඟට වැඩිය ආවෙ නෑ. අක්කයි, අම්මයි මගෙ දිහා බලාගෙන මට කතා කරන්නේ පිපී කියලා. හැම වෙලාවෙම ඒ නම කියනවා. මම හිතන්නේ ඒ අය මට නමක් දාලා. මගේ නම තමයි පිපී.



මම දැන් ඉන්නෙ හරිම සතුටින් යාළුවනේ. මේ අක්කා කියනවා මම එයාගේ මල්ලි කියලා එතකොට මේ අම්මා කියනවා මම එයාගෙ පුතා කියලා. මේ අක්කයි , අම්මයි මට පූස් බබාලටම හදපු කෑම දෙනවා. ඒවා හරිම රසයි ඒ වගේම කන්නත් ලේසියි යාළුවනේ. මට දැන් නිදාගන්න වෙනම තැනක් තියනවා. මටම කියලා පුළුන් පිරුනු පොඩි සත්තු, පාට පාට බෝල, සෙල්ලම්බඩු ගොඩාක් තියනවා. මම ඒවාට ගොඩාක් ආසයි. දැන් මට මේ ගෙදර ගොඩාක් පුරුදුයි යාළුවනේ. හැම තැනම දුව දුව මම දැන් සෙල්ලම් කරනවා. හොඳට සැපට නිදා ගන්නවා. හරිම රසට කෑම කනවා.



හැබැයි යාළුවනේ මට මොන තරම් සෙල්ලම්බඩු තිබුනත් මම වැඩිපුරම කැමති කුණු කූඩෙ තියෙන පත්තර ගුලි පෙරල පෙරල සෙල්ලම් කරන්න. තව යාළුවනේ මට රෑට සෙල්ලම් කරන්න කනාමැදිරි යාළුවොත් මේ ගෙදරට එනවා. මම ඒ අයට හරිම කැමතියි.

මේ ගෙදර තාත්තත් මට දැන් හරිම ආදරෙයි යාළුවනේ. එයයි අක්කයි තමයි මාව දොස්තර මාමා ළඟට ගෙනියන්නේ. දොස්තර මාමා ළඟට යන්න නම් මම ටිකක් බයයි. මට එයා බෙහෙතුත් විද්දා නෙ. තාත්තා තමයි මාව ඇවිදින්න ගෙනියන්නෙ. මේ ගෙදර මිදුලේ ලොකු මාළු යාළුවොත් ඉන්නවා. ඒ අය නම් මට කිසිම කරදරයක් කරන්නේ නෑ. හැබැයි මම නම් ටිකක් ඒ අයට බයයි. සමහර දවස් වලට අක්කාගෙ යාළුවො අපේ ගෙදර එනවා. එතකොට මට සෙල්ලම් කරන්න කට්ටිය ගොඩාක් ඉන්නවා. ඒ හැමෝම හරිම හොඳයි. මාව ආදරෙන් අතගානවා යාළුවනේ.



මේ ගෙදර අය මට කොච්චර ආදරෙයිද කියනවනම්, ඒ අයට පුළුවන් හැම වෙලාවකම මං ළඟට ඇවිල්ලා මාව හුරතල් කරනවා. මගේ අක්කා එයාගේ පන්ති කරන වෙලාවට මාව ඔඩොක්කුවේ තියන් ඉන්නේ. එතකොට මට හොඳට සැපට නින්ද යනවා. මේ ගෙදර අම්මා නිදාගන්න වෙලාවට මටත් එයා ළඟ නිදාගන්න දෙනවා. මේ ගෙදර තාත්තා මට අලුත් බලු යාළුවොත් මුනගැස්සුවා. හැමදාම රෑට තාත්තා මාව ඒ අය ළඟට ගෙනියනවා. මම මේ ගෙදරට ඇවිල්ලා මාසයක් සම්පූර්ණ වුනාම ඒගොල්ලන් පොඩි කේක් එකක් කපලා ඒක සැමරුවා. මේ හැමෝම මට ගොඩාක් ආදරෙයි.



ඉතින් යාළුවනේ මම තමයි පපී. මම චූටිම චූටි පූස් පැටියෙක්. මගේ ගෙදර අක්කයි, අම්මයි, තාත්තයි, ඉන්නවා. ඒ අයගේ සුරතලා තමයි මම. මම හරිම සතුටින්, ආදරෙන්, හුරතලෙන් ජීවත් වෙනවා. මේක තමයි මගේ ඇත්තම කතාව. මගේ කතාව කියවපු ඔයගොල්ලන්ට ගොඩාක් ස්තූතියි. ඔය හැමෝටමත් මම වගේ අසරණ වුන බලූ යාළුවන්, පූස් යාළුවන් ඕන තරම් මගතොට හමුවේවි. එතකොට ඔයගොල්ලොත් මගේ අක්කා වගේ ඒ අසරණයන්ට තමන්ට පුළුවන් තරමින් පිහිට වෙන්න. එතකොට ඔයගොල්ලන්ට ගොඩාක් සතුටු හිතෙයි. ඒ වගේම ඒ අසරණ වුණ බලූ යාළුවන්ටත්, පූස් යාළුවන්ටත් මුලු ලෝකයක් තරම් ඔයාව වටීවි. හරියට මට මගෙ අක්කයි, අම්මයි, තාත්තයි වගේ.





# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලූ ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්